## බදාදා

<u>පළමුවන කියැවීම</u> <u>ප්‍රඥා 6: 1–11</u>

සලමොන්ගේ ප්‍රඥාව පොතෙන් උපුටා ගත් පාඨයෙකි.

"රජවරුනි, ප්‍රඥාව කියා ඉගෙන ගන්න."

රජවරුනි, සවන් දී තේරුම් ගන්න. දුර රටවල පාලකයෙනි, සැමගේ අණසක යට දහසක් දෙන පාලනය කරන්නෙනි, ඔබේ පුරවැසියන් විශාල සංඛ්‍යාව ගැන පාරට්ටු කරන්නෙනි, මෙයට සවන් දෙන්න. බලය වූ කලි, ඔබට සමිඳුන්ගෙන් ලැබෙන දීමනාවකි. පරමාධිපත්‍යය, අති මහෝත්තමයාණන්ගෙන් පැමිණෙන්නකි. එතුමාණෝ ඔබේ ක්‍රියා විමසා බලන සේක. ඔබේ අදහස් සියුම් ලෙස පරීක්ෂා කරන සේක. රාජ්‍යයේ පරිපාලකයන් වශයෙන් ඔබ සාධාරණ ලෙස පාලනය නොකළාහු නම්, ව්‍යවස්ථාව නොපිළිපැද්දාහු නම්, දෙවිඳුන්ගේ අභිමතය පරිදි නොහැසුරුණෝ නම්, එතුමාණෝ ඔබ වෙත වේගයෙන් ද භයානකව ද පැමිණෙනු ඇත. බලවතුන් හට සහ ප්‍රභූන් හට කෲර විනිශ්වයක් වෙන් කර ඇත. බැගෑපත් අයට අනුකම්පා සහගතව කමා කරනු ලැබේ. බලවත් අයට දරුණු ලෙස දඬුවම් කරනු ලැබේ.

සියල්ලන්ට අධිපති සමිඳාණන් කිසිකෙනෙකු අබිමුව බියෙන් මිරිකෙන්නේ නැත. මහන්තත්ත්වය ගැන විස්මිත නොවනු ඇත. මන්ද, එතුමාණෝ ම ලොකු කුඩා සියල්ලන් මැවූ සේක. සියල්ලන්ට ම එක ලෙස සියලු දේ සපයන සේක.

එහෙත්, එතුමාණෝ බලයේ සිටින අය දැඩි ලෙස පරීක්ෂා කොට බලන සේක. එසේය, රජවරුනි, ප්‍රඥාව කුමක් ද කියා ඔබ ඉගෙන ගෙන එය කඩ නොකරන ලෙස මාගේ වචනය දෙන්නේ ඔබට ය.

මන්ද, ශුද්ධ දේ ශුද්ධ ලෙස පිළිපදින අය ශුද්ධවන්තයන් මෙන් ගණන් ගනු ඇත. ඔවුන්ගෙන් උපදෙස් ලබා ගැනීම නිසා ඔවුන් තුළ ඔවුන් හට ආරක්ෂාව සැලසෙනු ඇත. එබැවින් මාගේ වචනය පැමිණෙන තෙක් බලා සිටින්න. ඊට ආශාවෙන් සිටින්න. එය ඔබට උපදෙස් දෙනු ඇත.

දේව වචනය මෙසේ ය.

<u>පිළිතුරු ගීය</u> <u>ගීතාවලිය 82: 3–4, 6–7</u>

පිළිතුර : දෙවිඳාණෝ මිහි තලය විනිශ්වය කරන සේක.

ගීය :

දුබලුන්ට හා අනාථයන්ට යුක්තිය පසිඳලන්න.
පීඩිතයන් හා දිළිඳුන්ට යුක්තිය ඉටු කරන්න.
දුබලුන් හා දිළිඳුන් මුදාලන්න.
දුදනන්ගේ ග්‍රහණයෙන් ඔවුන් බේරා ගන්න.

ඔබ දෙවිවරු යයි මම කීවෙමි.
ඔබ සියල්ලෝ අති උත්තමයාණන්ගේ දරුවෝ වන්නහු ය.
එහෙත්, ඔබ අන් මිනිසුන් මෙන් මරණයට බිලි වන්නහු ය.
රජ දරුවන් මෙන් ඔබ සියලු දෙන වැටී යන්නහු ය.

සුපුවත් ජය නද 2 තෙසලෝනික 2: 14

ආලේලූයා! ආලේලූයා!
දෙවියන් වහන්සේ අප කැඳෙව්වේ,
සමිඳාණන් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ මහිමයට
පංගුකාරයන් වන පිණිස ය.
ආලේලූයා!

නොහොත්

සුපුවත් ජය නද 1 තෙසලෝනික 5: 18

ආලේලූයා! ආලේලූයා!
සියල්ලෙහි දී ස්තුති දෙන්න.
කිතුණුවන් වශයෙන් දෙවියන් වහන්සේ
ඔබගෙන් බලාපොරොත්තු වන්නේ මෙය වේ.
ආලේලූයා!

සුවිශේෂය ලූක් 17: 11-19

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

දෙවියන් වහන්සේට ගෞරව කරන පිණිස හැරී ආවේ, මේ විජාතිකයා පමණ ද?

ජේසුස් වහන්සේ ජෙරුසලම බලා යද්දී, සමාරිය හා ගලීලය මැදින් ගමන් ගත් සේක. උන්වහන්සේ එක් ගමකට ඇතුළු වූ කල, ලාදුරු රෝගීහු දස දෙනෙක් උන්වහන්සේට හමු වූහ. ඔවුහු දුරින් සිට, “ජේසුස් වහන්ස, ආචාරිනි, අපට කරුණා කළ මැනවැ” යි හඬ නගා කීය. උන්වහන්සේ ඔවුන් දැක, “ඔබ ගොස් පූජකවරුන් අභිමුවෙහි පෙනී සිටින්නැ” යි වදාළ සේක. ඔවුහු එසේ යද්දී පවිත්‍ර වූහ. ඔවුන්ගෙන් එක් කෙනෙක් තමා සුව වූ බව දැක, මහ හඬින් දෙවියන් වහන්සේට ගෞරව කරමින්, පෙරළා අවුත්, උන්වහන්සේගේ පාමුල වැඳ වැටී උන්වහන්සේට ස්තුති කළේ ය. ඔහු වනාහි සමාරිය ජාතිකයෙකි. ජේසුස් වහන්සේ කතා කරමින්, “දහ දෙනෙක් ම පවිත්‍ර වූවා නොවේ ද? අනෙක් නව දෙනා කොහි ද? මේ විජාතිකයා හැර, දෙවියන් වහන්සේට ගෞරව කරන පිණිස වෙන කිසිවෙක් හැරී ආවේ නැද්ද?” කියා ඔහුට කතා කොට, “නැගිට යන්න, ඔබේ ශ්‍රද්ධාව ඔබ සුව කළේ ය” යි වදාළ සේක.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.